# ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි කිවිදියගේ ඔස්ට්‍රේලියාවේ කෘතියක් බ්‍රිස්බන් නුවර සාකච්ඡාවට ගැනේ

ශ්‍රී ලංකවේ එවැන්ජලීන් පී විමක්‍රමගේ විසින් රචනා කරන ලද "එබව් ද ඕෂන් වයිඩ් ඇනඩ් ඩීප්" නම් ඉංග්‍රීසි පද්‍ය ග්‍රන්ථය පසුගියදූ ඔස්ට්‍රේලියාවේ බ්‍රිස්බන් නුවරට හඳුන්වා දීමේ උත්සවයක් ෆොරස්ට් ලේක්හි සමාජ කේන්ද්‍ර ගොඩනැගිල්ලේ දී පැවැත්විණි.

උත්සවයේ ප්‍රධාන ආරාධිතයා වූයේ ශ්‍රී ලංකාවේ ගරු කොන්සල් ඇන්ටන් සෝන් මහතාය.

පේරාදෙණියේ කලා උපාධිධාරිණියක වන වික්‍රමගේ මහත්මිය පාසැල් ගුරුවරියක් ලෙසද, ගුවන් විදුලි සංස්ථාවේ වැඩ සටහන් නිශ්පාදවරියක් ලෙසද, ජාතික අධ්‍යාපන ආයතනයේද, රාජ්‍ය භාෂා දෙපාර්තුමේන්තුවේද සේවය කර ඇත.

තම ජීවන අත්දැකීම් ඉංග්‍රීසි කවියට නැගීමට තුඩුදුන් කරුණු ඇය විස්තර කළාය. "එබව් ද ඕෂන් වයිඩ් ඇන්ඩ් ඩීප්" කෘතියට අඩංගු පද්‍ය සාකච්ඡාවට භාජනය කළේ ආචාර්ය නිමල් සේදර මහතාය. ඔහු ඉංග්‍රීසි කවියෙන් පොත ගැන කතා කිරීම ශ්‍රී ලංකා කොන්සලේටා වරයා අගය කරමින් කතා කළ අතර ඉංග්‍රීසි පොතපත බිහිවීමෙන් ශ්‍රී ලංකාව පිළිබඳ යහපත් මතයක් මෙවන් රටවල ඇතිවන බව කීවේය. සිංහබාහු නාට්‍යයේ මුල් නිෂ්පාදනයේ රඟපෑ මාලනී රණසිංහ මහත්මිය එහි ගීතයක් ගායනය කළ අතර ආචාර්ය්‍ය පියසිරි පැලැන්ද ඇන්ජලීන් ගේ කෘතියේ පද්‍ය කිහිපයක් සිංහලට පරිවර්තනය කර ඉදිරිපත් කළෝය.

උත්සවයේ ස්තූතිකතාව මහාචාර්ය රොහාන් ජයසිංහ විසින් පවත්වන ලදී.







## මමත්වය

ටැං පෙළපතේ එක් සමයක අගමැති වරයා රාජ්‍ය නායකයා සේ ම හමුදාවේ ප්‍රධානියා ද වුණා. ජාතික වීරයකු ලෙස සැලකුම් ලැබුවා. බෙහෙවින් ධනවත්, බලවත් හා ප්‍රසිද්ධ අයකු වුව ද ඔහු නිහතමානී බුදුදහමට ලැදි අයකු වුණා. ඔහු නිතර ම සෙන් ගුරුවරයකු මුණ ගැසෙන්නට ගියා.

ඔහුගෙන් ඉගෙන ගත්තා. දෙදෙනා අතර තිබුණු සබඳතාව අගමැතිවරයකු හා භික්ෂුවක් අතර ඇතිවන සාමාන්‍ය දුරස්ත බවකින් යුක්ත වුණේ නෑ. සමීප මිතුරු බවක්. ඒ වගේ ම සෙන් ගුරු වරයා සහ ඔහුගෙන් ඉගෙන ගන්නා ගෝලයාගේ ස්වරූපය ම ඉස්මතු වුණා. දවසක් අගමැතිවරයා ගුරුතුමාගෙන් ප්‍රශ්නයක් ඇසුවා. "හාමුදුරුවනේ, බුදුදහමට අනුව මමත්වය කියන්නේ මොකක්ද?"

ගුරුවරයාගේ මුහුණ රතු වුණා. මහන්තත්වයෙන් යටහත් කෙනකුට අමතන ලීලාවෙන් වගේ ඔහු අගමැති වරයාගේ කෝපය
ඇවිස්සෙන පරිදි මෙසේ ප්‍රශ්න කළා.

"මොන තරම් මෝඩ තකතිරු ප්‍රශ්නයක් ද ඒක?"
ගුරුතුමා මේ විදියට කවදාවත් කථා කර නැහැ. අගමැතිවරයා තරහෙන් බුම්මාගත්තා.

"අගමැතිතුමනි. අන්න ඒක තමයි මමත්වය කියන්නේ." සෙන් ගුරුතුමා සිනාසෙමින් කිව්වා.

## බළලා

ගුරු හිමියෝ සිසුවන් ද පිරිවරාගෙන සවස් යාමයේ භාවනාව ආරම්භ කළා. අසපුවේ වාසය කළ බළලෙක් ඔවුන්ට කරදර කළා. සවස භාවනා කරන කාලය තුළ බළලා බැඳ දමන ලෙස ගුරු හිමි උපදෙස් දුන්නා. පසු කලෙක ගුරුවරයා මිය ගියා. එහෙත් භාවනා කරන වේලාවල බළලා බැඳ තැබීමේ පුරුද්ද දිගට ම පැවතුණා. බළලා මිය ගිය පසු වෙනත් බළලෙක් ඉහත කී කාලය තුළ බැඳ දමන්නට ගෝලයන් පුරුදු වුණා. සිය වස් ගණනාවකට පස්සේ එකී සිසු පරම්පරාවෙන් පැවත එන පිරිසේ උගත්තු භාවනා කරන කාලයේ දී බළලකු බැඳ දැමීමේ අර්ථය හා ආදීනව විග්‍රහ කරමින් ධර්ම කාරණා ලියන්නට පටන් ගත්තා.

## අවබෝධය

ටෙනෝ දස වසරක ආධුනික පුහුණු කාලයෙන් පස්සේ සෙන් ගුරුවර පදවිය ලැබුවා. වැසි දවසක ඔහු සුප්‍රසිද්ධ නැන්අන් ගුරුතුමා බැහැ දකින්නට ගියා. ගුරුතුමා ඔහු පිළිගත්තා.
"ඔබේ ලී පාවහන් සහ කුඩය දොරකඩ තැබුවාද?"
"එහෙමයි."
"මට කියන්න." ගුරුතුමා සන්සුන් ලෙස අමුත්තා විමසිල්ලට බඳුන් කළා. "කුඩය තිබ්බේ සෙරෙප්පුවලට දකුණු පැත්තෙන් ද, වම් පැත්තෙන් ද?"
ටෙනෝ නිසි පිළිතුරු දෙන්න අසමත් වුණා.
'මම හරියට ම අවදියෙන් නෙවෙයි ඉන්නේ.'
තම සැබෑ තත්ත්වය අවබෝධ කර ගත් ටෙනෝ නැන්අන් ගුරුතුමාගේ ශිෂ්‍යයකු ලෙස තවත් අවුරුදු දහයක් පුහුණුව ලැබුවා.

**මහින්ද ගුණවර්ධන**



**සන්නස ගැන ඔබේ අදහස් අපට ලියන්න.**

Sannasa, Suite 504, 530 Little Collins Street, Melbourne 3000

Via Sannasa Website:
Visit www.sannasa.com.au